# බස්නාහිර පළාතේ පළාත් සභා රැස්වීම

## 2014 ජූලි මස 22 වන අඟහරුවාදා

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි**
**බස්නාහිර පළාත් සභා ගොඩනැගිලි සංකීර්ණයේ සභා ශාලාවේදී පවත්වන ලද රැස්වීම**

පූ.භා.09.34 ට සභාව රැස් විය. ගරු සභාපතිතුමා මූලාසනාරූඪ විය.

- **පැමිණීම :**

| | |
|---|---|
| ගරු සුනිල් විජේරත්න | (සභාපතිතුමා) |
| ගරු යසපාල කෝරළගේ | (නියෝජ්‍ය සභාපතිතුමා) |
| ගරු ප්‍රසන්න රණතුංග | (බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකි රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා) |
| ගරු උපාලි කොඩිකාර | (බස්නාහිර පළාතේ විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා) |
| ගරු නිමල් ලාන්සා | (බස්නාහිර පළාතේ ප්‍රවාහන, ක්‍රීඩා හා යෞවන කටයුතු, කාන්තා කටයුතු, ආහාර සැපයීම හා බෙදා හැරීම, සමුපකාර සංවර්ධන, ගෘහ ආර්ථික ප්‍රවර්ධන, ධීවර, ග්‍රාම සංවර්ධන, සංචාරක, ආයෝජන ප්‍රවර්ධන සම්බන්ධීකරණ සහ සත්ත්ව නිෂ්පාදන හා සංවර්ධන අමාත්‍යතුමා) |
| ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල | (බස්නාහිර පළාතේ කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු රංජිත් සෝමවංශ | (බස්නාහිර පළාතේ සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) |
| ගරු ගාමිණී තිලකසිරි | (සභානායකතුමා) |
| ගරු මංජු ශ්‍රී අරංගල | (විපක්ෂ නායකතුමා) |
| ගරු සිසිර ජයකොඩි | (ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |
| ගරු හර්ෂණ සුපුන් රාජකරුණා | (විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා) |

- **ගරු මන්ත්‍රීවරු** :

අනුරුද්ධ ලේකම්ගේ
අසෝක රන්වල
අශෝක දයාරත්න
අනන්ද හරිස්චන්ද්‍ර ද සිල්වා
අමල් සිල්වා
අර්ෂාඩ් නිසාම්ඩීන්
ඇන්ටනී උපුල් රාජිත
ඉන්දික බණ්ඩාර
ඉසුර දේවප්‍රිය
උදාර රත්නායක
උපාලි ගුණරත්න
උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ
එම්.එස්.එම්. රහීම්
එස්.එම්. මරික්කාර්
එස්.ඒ. සමන්මලී සකලසූරිය මෙනෙවිය
එඩ්වඩ් ගුණසේකර
එස්. කුහවරදන්
ඕ.ඩබ්ලිව්. ප්‍රසන්න සංජීව
කවින්ද හේෂාන් ජයවර්ධන
කිත්සිරි කහටපිටිය
කීර්ති කාරියවසම්
කේ.ඩී. අරුණ දීපාල්
කෝකිලා හර්ෂනී ගුණවර්ධන මැතිනිය
ගමගේ නිහාල් ප්‍රේමශාන්ත පෙරේරා
ගුණසිරි ජයනාත්
චන්දන ජයකොඩි
ජගත් අංගගේ
ජගත් කුමාර
ජගත් පී. විතාන
ජනක දීපාල් වැලිවත්ත
ජයන්ත ද සිල්වා
ඩී.ඩබ්ලිව්. පුෂ්පකුමාර ද සිල්වා
නලින්ද ජයතිස්ස
නව්සර් ෆව්සි
නිමල් ආර්. පීරිස්
නිමල් චන්ද්‍රරත්න
නිරෝෂ් ඩිල්ෂාන් ජයවර්ධන
නිරෝෂන් පාදුක්ක
නිරෝෂා අතුකෝරල මැතිනිය
නිශාන්ත ශ්‍රී වර්ණසිංහ
නීල් සුනේත්‍රලාල් ප්‍රනාන්දු
පියල් නිශාන්ත
පී.ආර්.පී. අබේගුණවර්ධන
පී.ඩී.අබේරත්න
ප්‍රදීප් උඳුගොඩ
බී.පී. ලක්ෂ්මන් ගුණවර්ධන
මල්ෂා කුමාරණතුංග මැතිනිය
මහින්ද ජයසිංහ
මහේෂ් අල්මේදා
මංජුල බුද්ධදාස
මෙරිල් පෙරේරා
මොහොමඩ් මුජිබුර් රහුමාන්
මෙහොමඩ් ෆයිරුස්
මොහොමඩ් ෆායිස්
යූ.එල්.එන්.පී. උඩවෙල
යූ. ජෝර්ජ් පෙරේරා
රජිත හපුආරච්චිගේ
රවීන්ද්‍ර යසස් කුමානායක
රවී විජේසේකර
රොජර් සෙනෙවිරත්න
රොඩ්නි රුඩෝල්ෆ් ෆ්‍රේසර්
රොයිස් විජිත
ලක්ෂ්මන් නිපුණ ආරච්චි
ලයනල් ජයසිංහ
ලලන්ත ගුණසේකර
ලලිත් එල්ලාවල
ලලිත් වර්ණකුමාර
ලෙනාඩ් කරුණාරත්න
ශිරන්ත අමරසේකර
ශ්‍රීනාත් පෙරේරා
සන්ධ්‍යා සිරිවර්ධන මැතිනිය
සලෝචන ගමගේ
සහන් ප්‍රදීප්
සෙනල් වෙල්ගම
සුනිල් ජයමිණි
සුනිල් වටගල
සුමිත්ලාල් මැන්දිස්
සුසාර දිනාල්
සුසිල් කිඳෙල්පිටිය
හෙක්ටර් බෙත්මගේ

- **නොපැමිණීම :**
- **ගරු මන්ත්‍රීවරු**

අනුරාධ විමලරත්න
ආනන්ද රංජිත් රූපසිංහ
ඇ.ශ්‍රීනාත් ම. පෙරේරා
ඉෆ්තිකාර් ජෙමීල් මරික්කාර්
උදේන විජේරත්න
කේ.ඩී. ලාල්කාන්ත
කොලන්නගේ වජිර පෙරේරා
මනෝ ගනේෂන්
රෝස් ප්‍රනාන්දු මෙනෙවිය
ලලිත් වනිගරත්න
විජිත් ප්‍රියන්ත
සේනක දමයන්ත ද සිල්වා
හිරුණිකා එරාංජලී ප්‍රේමචන්ද්‍ර මෙනෙවිය

## 01. ගරු සභාපතිතුමාගේ නිවේදන :

*I*

*"බස්නාහිර පළාතේ සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යතුමාගේ උපදෙස් පරිදි ගරු මන්ත්‍රීවරුන් සඳහා වෛද්‍ය සායනයක් 2014 අගෝස්තු මස 05 වන දින පෙ.ව. 07.30 සිට මෙම පළාත් සභා පරිශ්‍රයේදී පැවැත්වෙන අතර, එහිදී බෝ නොවන රෝග සම්බන්ධයෙන් වෛද්‍ය පරීක්ෂණ, දන්ත සායන මෙන්ම අක්ෂි සායනද පැවැත් වේ. රුධිරගත සීනි සහ ලිපිඩ ප්‍රමාණ පරීක්ෂාවන්ට සහභාගිවීම සඳහා පැය 12 ක පමණ කාලයක් නිරාහාරව සිට පැමිණීම අත්‍යවශ්‍ය වන අතර සායනය පැවැත්වෙන්නේ අගෝස්තු මස 05 වන දිනයේ එනම්, මීළඟ පළාත් සභා රැස්වීම දිනයේ උදෑසන බවත් ගරු සභාපතිතුමා විසින් වැඩි දුරටත් දැනුම් දෙන ලදී. "*

*II*

*"ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් කටයුතු කරමින් සිටි ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.07.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාව ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සාමාජිකයෙකු වශයෙන් නම් කර ඇති බවත්,*

*අවදි කාරක සභාවේ සාමාජික වශයෙන් කටයුතු කරමින් සිටි කේ.ඩී. අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමා වෙනුවට 2014.07.17 දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉන්දික බණ්ඩාර ගරු මන්ත්‍රීතුමාව අවදි කාරක සභාවේ සමාජිකයෙකු වශයෙන් පත් කර ඇති බවත් ගරු සභාපතිතුමා විසින් දැනුම් දෙන ලදී. "*

## 02. කාරක සභා වාර්තා :

2014.07.08 වන දින පැවැති සභා කටයුතු කාරක සභා රැස්වීම් වාර්තාව ගරු සභාපතිතුමා විසින් සභාවට පිළිගන්වන ලදී.

***පූ.භා. 10.19 ට පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් පූ.භා. 11.04 ට යළිත් රැස් විය.***

## 03. රීති අංක 107 යටතේ යෝජනාව :

**මංජු ශ්‍රී අරංගල - ගරු විපක්ෂ නායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව හර්ෂණ රාජකරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා විසින් ස්ථිර කරන ලදී.**

*"පොදු වැදගත්කමින් යුක්ත වූද, හදිසි වූද මතු සඳහන් වන යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම පිණිස කාර්යපටිපාටි රීති 107 යටතේ සලසා ඇති ප්‍රතිපාදනවලට අනුකූලව සහ ඊට ආනුෂංගිකව කාර්යපටිපාටි රීති 8(5), 8(6), 15(2), 15(5), 53(2), 53(3), 57(2), 57(3) හා 57(5) යන රීතීන් අත්හිටුවිය යුතු යැයි යෝජනා කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***එවලේ, මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා එකී යෝජනාවට විරුද්ධ වූයෙන්, පළාත් සභාවේ බෙදීමක් ඇති වූ බැවින් ගරු සභාපතිතුමා විසින් සීනුව නාද කිරීමට නියෝග කරන ලදී.***
***පසුව ප්‍රශ්නය විමසන ලදුව, රීති අත්හිටුවීමේ යෝජනාව රීති අංක 107 (3) යටතේ අහෝසි විය.***

## 04. පෞද්ගලික මන්ත්‍රී යෝජනාව : බස්නාහිර පළාතේ කැළි කසළ සන අපද්‍රව්‍ය කළමනාකරණ ක්‍රියාවලිය නාගරික සංවර්ධන අධිකාරිය හා එක්ව විධිමත් කිරීම

**නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමා විසින් ස්ථිර කරන ලදී.**

*" බස්නාහිර පළාත තුළ කැළි කසළ, සන අපද්‍රව්‍ය නිසි අයුරින් පාලනය කිරීම, එකතු කිරීම, බැහැර කිරීම හා එහි අතුරුඵල ලෙස විදුලි නිෂ්පාදනය කිරීම හා කොම්පොස්ට් පොහොර නිෂ්පාදනය කිරීමේ ක්‍රියාවලිය*

*සාර්ථකව ක්‍රියාත්මක කිරීමට බස්නාහිර පළාතේ ඝන අපද්‍රව්‍ය අධිකාරිය පුරා වසර 07 කට අධික කාලයක් තිස්සේ අපොහොසත් වී ඇත.*

*මෙම කාලය තුළ පළාතේ ප්‍රධානතම හා අත්‍යවශ්‍යම විෂයයක් වන මෙම ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂමව හා ඵලදායිත්වය ඉහළ තත්ත්වයක ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පළාතටම දැනී ඇත.*

*එම නිසා නාගරික සංවර්ධන අධිකාරිය විසින් දැනට කරගෙන යනු ලබන නගර සංවර්ධන ක්‍රියාවලිය තවත් ශක්තිමත් කරමින් මෙවැනි ව්‍යාපෘති සඳහා වඩාත් බල සහිත මූල්‍ය ශක්තියෙන් හෙබි තාක්ෂණික හැකියාවක් ඇති මධ්‍යම රජය සතු නාගරික සංවර්ධන අධිකාරිය හා ඒකාබද්ධව යම් කාල රාමුවකට සීමා කරන ලද කෙටි කාලීන හා දිගු කාලීන සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පළාත් සභාව අදහස් කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***

***අ.භා. 12.26 ට ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා] මූලාසනාරූඪ විය.***

***අනතුරුව, ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***

## 05. රීති අංක 30 හා 31(ආ) යටතේ යෝජනාව :

***ගාමිණී තිලකසිරි ගරු සභානායකතුමා විසින් ඉදිරිපත් කරන ලද පහත සඳහන් යෝජනාව සභා සම්මත විය.***

*" රීති අංක 30 හා 31(ආ) යටතේ සභාවේ වැඩ කටයුතු සඳහා කාලය දීර්ඝ කළ යුතු යැයි" යෝජනා කරනවා.*

***මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 30 යටතේ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න මාලාවට ගරු ප්‍රධාන අමාත්‍යතුමා විසින් වාචිකව පිළිතුරු[1] සපයන ලදී.***

*ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා විසින් රීති අංක 31(ආ) යටතේ ඉදිරිපත් කරනු ලැබූ රට පුරා ගවයන් හා ඌරන් ඇති කිරීමේ සත්ත්ව කර්මාන්තයට තර්ජනයක් බවට පත් වන කුර හා මුඛ රෝග පැතිර යෑම පිළිබඳ යෝජනාව[2] සාකච්ඡාවට ගන්නා ලදී.*

## 06. කල් තැබීම :

එකල්හි වේලාව අපර භාග 02.00 ට ආසන්න වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා විසින් පළාත් සභාව කල් තබන ලදී.

***ඊට අනුකූලව පළාත් සභාව, අ.භා. 01.57 ට, 2014 අගෝස්තු මස 05 වන දින පූ.භා. 09.30 වන තෙක් කල් ගියේය.***

හේමන්ත සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2014.07.22
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5 වන මහල,
බී පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

කුමා/22
Minuts 2014.07.22 - Hansard Section

---

[1] 2014.07.22 වන දින නිල වාර්තාවේ පිටු අංක 58 හා 59 බලන්න.
[2] 2014.07.22 වන දින නිල වාර්තාවේ පිටු අංක 59 හා 60 බලන්න